Department of Education, Sabaragamuwa Province/ Weekly School

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**විෂය - ගිණුම්කරණය**

**සතිය - 4**

**ශ්‍රේණිය - 12**

**සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.**

නිපුණතාව 5.0 - මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.

නිපුණතා මට්ටම 5.9 - ඓතිහාසික පිරිවැය සංකල්පය භාවිත කරයි.

- ව්‍යාපාරයක් සතු සම්පත් හා ඒ සඳහා දැරූ වියදම්,ඒවා අත්පත් කරගත් අවස්ථාවේ දී හුවමාරු වූ සත්‍ය පිරිවැය මත පොත්වල වාර්තා කළ යුතු බව ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් අදහස් වේ.
- පිරිවැය මත වාර්තා කිරීම නිසා,අගය තහවුරු කර ගැනීම පිළිබඳ,
    - විශ්වාසදායී බවත්
    - පහසු බවත් ඇති වේ.
- එමෙන්ම ගිණුම් තැබීමේ කටයුතුද පහසු වේ.

**<u>ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර වන අවස්ථා</u>**

- දේපළ,පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අගයට වාර්තා කිරීම.
- තොගය ශුද්ධ උපලබ්ධි අගයට වාර්තා කිරීම.

**<u>ඓතිහාසික පිරිවැය සංකල්පයේ යෙදීම් -</u>**

1.දේපළ,පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ දී (ප්‍රථම වතාවට) පිරිවැයට වාර්තා කිරීම.
2.දේපළ,පිරියත හා උපකරණ සම්බන්ධව පසුකාලීනව දරන වියදම් ද පිරිවැයට වාර්තා කිරීම.

**<u>අභ්‍යාස</u>**

1.ඓතිහාසික පිරිවැය සංකල්පය පැහැදිලි කරන්න.
2.ඓතිහාසික පිරිවැය සංකල්පය මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වන ආකාරය දක්වන්න.
3.ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර වන අවස්ථා මොනවාද?